# සාමාන්‍ය සමයේ විසිඑක්වන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමු හසුනෙන් කොටසකි. 1 තෙසලෝනික 2 : 9-13

"අපි දිවා රෑ දෙක්හි වෙහෙස මහන්සියෙන් සුබ අස්න ඔබට දේශනා කළෙමු."

මන්ද, සහෝදරවරුනි, අපි කෙතරම් වීර්යයෙන් හා වෙහෙස මහන්සියෙන් හා සේවය කළෙමු දැයි ඔබට මතක ඇත. අපි ඔබගේ කිසිවෙකුට බරක් නොවන පිණිස දිවා රෑ දෙකේහි රැකියාවක යෙදෙමින් දෙවියන් වහන්සේගේ සුබ අස්න ඔබට දේශනා කළෙමු.

සැදැහැවතුන් වන ඔබ අතරෙහි අපි කෙතරම් ශුද්ධ ව, දැහැමිව, නිදොස්ව හැසුරුණෙමු ද කියා ඔබ පමණක් නොව දෙවියන් වහන්සේත් සාක්ෂි දරණ සේක. පියෙකු සිය දරුවන්ට සලකන පරිදි අප ඔබ ගැන සැලකූ හැටි ඔබ දන්නහුය. දෙවියන් වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත් කැඳවනු ලැබූ ඔබ, උන් වහන්සේට ඔබින පරිදි ජීවත් වන ලෙස අපි ඔබ එකිනෙකාට අනුශාසනා කළෙමු. ධෛර්යය දුනිමු. අනුබල දුනිමු. තවත් කරුණක් ගැන අපි දෙවියන් වහන්සේට නොකඩවා තුති පුදමු. දෙවියන් වහන්සේගේ පණිවුඩය අපි ඔබ වෙත ගෙනා කල, ඔබ එය අසා පිළිගත්තේ මනුෂ්‍යයන්ගෙන් එන පණිවුඩයක් මෙන් නොව, ඇත්තෙන්ම දෙවියන් වහන්සේගෙන්ම එන පණිවුඩයක් හැටියට ය. මන්ද, අදහන ඔබ අතර ක්‍රියා කරන්නේ දෙවියන් වහන්සේ ය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 139 : 7 – 12

පිළිතුර: සමිඳුනි, ඔබ මා සියුම් ලෙස විමසා දැනගත් සේක.

ගීය:

ඔබෙන් සැඟවී මම කොතැනට යම් ද? ඔබ ඉදිරියෙන් කොතැනට පලා යම් ද? මා ස්වර්ගයට නැගුණත් ඔබ එහි ය. පාතාලයට බැස සැතපුණත් ඔබ එහි ය.

මා නැගෙනහිරට ඉගිලී ගියත්, බටහිර මුහුදු සීමාන්තයේ විසුවත් එහිදීත් ඔබේ අත මට මඟ පෙන්වන්නේ ය. ඔබේ දකුණත මට පිහිට වන්නේය.

අඳුර මා වසා ගනීවා! මා අවට පැතිරෙන එළිය අඳුරක් වේවා! යි මා කීවත්, අඳුර ඔබට අඳුරක් නොවේ. අඳුරත් එළියත් ඔබට එක හා සමාන ය.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචනවලින් ය"යි සමිඳාණන් වහන්සේ වදාරණ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
යමෙක් ක්‍රිස්තුස් වහන්සේගේ දහම පිළිපදින්නේ ද
ඒකාන්තයෙන්ම ඔහු තුළ දෙවියන් වහන්සේගේ ප්‍රීතිය සම්පූර්ණ වනු ඇත.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 23: 27-32

"ඔබ දිවැසිවරයන් මැරූ අයගේ පුත්‍රයන් බව ඔබම පිළිගන්නහු ය."

"විනයධරයෙනි, පරිසිවරුනි, කෛරාටිකයන් වූ ඔබට වන විපතක මහත! මන්ද, ඔබ හුණු ගා සුදු කළ සොහොන්වල ට සමානය. ඒවා පිටතින් ශෝභනව පෙනෙතත් ඇතුළත මළවුන්ගේ ඇටකටුවලින් ද සියලු ආකාර කැළිකසළින් ද පිරී තිබේ. එලෙසම ඔබත් මිනිසුන් අබිමුවෙහි පෙනුමට පිටතින් සිල්වත් ය. එහෙත් ඇතුළතින් කුහකකමින් හා දාමරිකකමින් පිරී සිටින්නහුය."

"විනයධරයෙනි, පරිසිවරුනි, කෛරාටිකයෙනි, ඔබට වන විපතක මහත! මන්ද, ඔබ දිවැසිවරුන්ට සොහොන් ඉදි කොට, සිල්වතුන්ගේ සොහොන් කොත් අලංකාර කරමින්, 'අපේ මුතුන් මිත්තන් ජීවත්ව සිටි කාලයේ දී අපිත් සිටියෙමු නම්, දිවැසිවරයන් මැරීමට අපි සහාය නොවන්නෙමු'යි කියන්නහුය. මෙසේ ඔබ දිවැසිවරයන් මැරූ අයගේ පුත්‍රයන් බව ඔබම පිළිගන්නහුය. එබැවින් ඔබේ මුතුන් මිත්තන් පටන් ගත් දෙය ඔබ දැන් නිමාවට පත් කරන්න."

සුවිශේෂ වාක්‍යය එසේය.